# අන්තර්ජාතික වෙලඳාම

**විෂය නිර්දේශය මත බර තැබීම - 5 %**

පාඩම් අන්තර්ගතය

◈ ප්‍රශ්ණ සහ පිලිතුරු ආකාරයෙන් පහත කොටස් ආවරණය කෙරේ.

- FOB ගිවිසුම්
- CIF ගිවිසුම්
- මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම
- නෞභාරපත්‍ර
- අන්තර්ජාතික වෙළඳාමේදී භාවිතා වන ප්‍රධාන ගෙවීමේ ක්‍රම
- අන්තර්ජාතික වෙලඳ ආරවුල් නිරවුල් කිරීම

# අන්තර්ජාතික වෙළඳාම

1) FOB ගිවිසුමක් නිර්වචනය කරන්න.

මෙහි අර්ථය වන්නේ නැවට පැටවීම දක්වා නොමිලේ යන්නයි. ( Free On Board ). විකුණුම්කරු විසින් භාණ්ඩ නැව්ගත කිරීමට වැයවන පිරිවැය දැරිය යුතු අතර, භාණ්ඩ නැවට පැටවූ පසු අලෙවිකරුගේ වගකීම අවසන් වන අතර, නැව්ගත කළ වහාම භාණ්ඩ වල අයිතිය ගැනුම්කරු වෙත මාරු වේ. මෙහිදී භාණ්ඩ ප්‍රවාහනය සහ රක්ෂණය සම්බන්ධ පිරිවැය ගැනුම්කරු විසින් දැරිය යුතුය. අදාල භාණ්ඩ තොගය නැවේ තට්ටුව / ගරාදිය පසු කල වහාම ගිවිසුම සම්බන්ධයෙන් විකුණුම්කරුගේ වගකීම අවසන් වන අතර, එතැන් සිට භාණ්ඩ වල අවදානම ගැනුම්කරු සතුවේ.

ඒ අනුව FOB විකුණුම්කරුවෙකුගේ කාර්යභාරය

- භාණ්ඩ නැවට පැටවීම දක්වා ප්‍රවාහනය කිරීම
- නැවට පැටවීමේ ගාස්තු / වියදම් දැරීම
- අපනයන තීරුබදු ගෙවීම
- නැවට පටවන තෙක් වෙනත් වියදම් ඇත්නම් ඒවා ගෙවීම

ඒ අනුව FOB ගැනුම්කරුවකුගේ කාර්යභාරය

- භාණ්ඩ ප්‍රවාහනය සඳහා නැවක් තෝරා ගැනීම
- එම නැව සමග මුහුදු ප්‍රවාහන ගිවිසුමකට එලඹීම සහ නැව් කුලිය ගෙවීම
- මුහුදු ගමන සඳහා රක්ෂණ ගිවිසුමකට එලඹීම සහ එම රක්ෂණ මුදල ගෙවීම
- භාණ්ඩ ගොඩබෑමේ ගාස්තු සහ ආනයන තීරුබදු ගෙවීම

2) CIF ගිවිසුමක් නිර්වචනය කරන්න.

මෙහි අර්ථය වන්නේ පිරිවැය රක්ෂණය නැව්කුලිය ( Cost, Insurance, Freight ) යන්නයි. මෙහිදී විකුණුම්කරු විසින් භාණ්ඩ තොගය නැව්ගත කිරීමෙන් අනතුරුව භාණ්ඩ තොගය නැව්ගත කිරීමේ පහත ලියවිලි ගැනුම්කරු වෙත යැවීම මගින් ගිවිසුම ක්‍රියාත්මක කරයි.

- නෞභාරපත්‍රය - නාවික ප්‍රවාහන ගිවිසුමක් පවතින බවට සාක්ෂියකි.
- මුහුදු රක්ෂණ සහතිකය - රක්ෂණ ගිවිසුමක් පවතින බවට සාක්ෂියකි.
- ඉන්වොයිස් පත - භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් පවතින බවට සාක්ෂියකි.
- මීට අමතරව විකිණීමේ ගිවිසුමට අදාල වන වෙනත් ලේඛණ ( ප්‍රමිති සහතික, බර හෝ තත්වය පිලිබඳ සහතික, සනීපාරක්ෂක සහතික ආදිය )

එම ලියවිලි ගැනුම්කරුට ලැබුණු පසු භාණ්ඩ සම්බන්ධයෙන් විකුණුම්කරුගේ වගකීම අවසන් වන අතර, එම ලියකියවිලි වලට එරෙහිව ගෙවීම් පියවීම ගැනුම්කරුගේ වගකීමයි.

එනම්, භාණ්ඩ තොගය තමන් වෙත ලඟා වීම නොසලකා අදාල ලියවිලි තමන් වෙත ලැබීම මත ගැනුම්කරු විසින් විකුණුම්කරු වෙත මුදල් ගෙවිය යුතුය. එමනිසා CIF ගිවිසුමක් ලියවිලි විකිණීමේ ගිවිසුමක් ලෙසද හැඳින්විය හැකිය.

3) CIF ගිවිසුමක මිල යන්නට අයත් වන්නේ මොනවාද ?

භාණ්ඩ වල වටිනාකම, රක්ෂණ වියදම්, ප්‍රවාහන වියදම්

4) CIF විකුණුම්කරුවකුගේ කාර්යභාරය කුමක්ද ?

භාණ්ඩ සඳහා ඉන්වොයිස් පිලියෙල කිරීම, භාණ්ඩ නැව්ගත කිරීම, මුහුදු ප්‍රවාහන ගිවිසුමකට එළඹීම, ගැනුම්කරුට වාසිදායක වන්නා වූ රක්ෂණ පහසුකම් සඳහා අවශ්‍ය වැඩපිළිවෙල සැකසීම, ඉහත ලේඛණ ගැනුම්කරු වෙත යැවීම.

5) CIF ගැනුම්කරුවකුගේ කාර්යභාරය කුමක්ද ?

▲ ලේඛණ ලැබුණු වහාම ප්‍රවාහන කුලිය හැර අනෙකුත් මිල ගණන් ගෙවීම. ( භාණ්ඩ පරීක්ෂා කිරීමෙන් පසුව ඔහුට ගෙවීම් අතපසු කිරීමට හැකියාවක් නැත.)
▲ නෞභාරපත්‍රයට අනුව ගමනාන්ත වරායේදී බඩු බෑමට වැය වන වියදම්, බත්තල් ගාස්තුව සහ බිම් කුලී ගෙවීම.
▲ ආයනය බදු, රේගු ගාස්තු ඇත්නම් ඒවා ගෙවීම.

6) මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අදාලව මෙරට ප්‍රධාන ව්‍යවස්ථාපිත නීතිය කුමක්ද ?
1982 අංක 21 දරණ මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම පිළිබඳ පනත

7) මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට සම්බන්ධ පාර්ශවයන් 3 කවුද ?
නැව් හිමියා, ප්‍රවාරණකරු ( නැව කුලියට ගන්නා අය ), අනුප්‍රේෂිතලාභියා හෙවත් බඩු භාර ගන්නා අය

8) නෞභාරපත්‍රයක්( Bill Of Lading ) යනු කුමක්ද ?
යම් භාණ්ඩ තොගයක් නැවට පටවා ඇති බවට හෝ නැව්ගත කිරීම සඳහා ලැබී ඇති බව ප්‍රකාශ කරමින් නැව් හිමියාගේ, නැවේ ප්‍රධානියාගේ හෝ නැව් හිමියා වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයෙකුගේ අත්සන සහිතව නිකුත් කරන ලේඛණයකි. ( ප්‍රවාහන ගිවිසුමක් ඇති බවට මෙය සාක්ෂියකි.)

හේග් විස්බි රීතීන්හි 3 වන ව්‍යවස්ථාව අනුව නැවකට භාණ්ඩ පටවන සෑම අවස්ථාවකදීම පහත කරුණු සඳහන් කරමින් නෞභාරපත්‍රයක් නිකුත් කල යුතුය.

- ✸ භාණ්ඩ හඳුනාගැනීමට අවශ්‍ය සලකුණු
- ✸ භාණ්ඩ වල ප්‍රමාණය සහ බර
- ✸ භාණ්ඩ වල තත්වය

9) නෞභාරපත්‍රයක ලක්ෂණ / වැදගත් කම් 3 ක් ලියන්න.

□ එය මුහුදෙන් භාණ්ඩ රැගෙන යාමේ ගිවිසුමක් පවතින බවට සාක්ෂියකි.
□ නෞභාරපත්‍රයේ මුල් පිටපත තමා වෙත ඉදිරිපත් කරන ගැනුම්කරුට, භාණ්ඩ රැගෙන යන්නා විසින් භාණ්ඩ ලබා දිය යුතු බැවින් එය භාණ්ඩ වල හිමිකම පිළිබඳ ලේඛණයකි. ( එසේම, භාණ්ඩ තොගය වරායට ලඟා වීමට ප්‍රථමව වුවද නෞභාර පත්‍රය පිටසන් කිරීම මගින් භාණ්ඩ තොගයේ හිමිකාරීත්වය

පැවරිය හැකිය. මේ බව **වනාතවිල්ලුව වයින් යාර්ඩ් ලිමිටඩ් එ. කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන්** නඩුවේදී පිලිගෙන ඇත. )

- එය භාණ්ඩ නැව්ගත කොට ඇති බවට හෝ නැව්ගත කිරීම සඳහා ලැබුණු බව දන්වමින් භාණ්ඩ රැගෙන යන්නා විසින් හෝ ඔහු වෙනුවෙන් නිකුත් කරනු ලබන කුවිතාන්සියකි. ඒ අනුව, නෞභාරපත්‍රයේ සඳහන් භාණ්ඩ ප්‍රමාණය එහි සඳහන් තත්වයෙන් අදාල අදාල වරාය වෙත ප්‍රවාහනය කර දීම පිලිබඳව නැව් සමාගම වෙත වගකීමක් ඇත.

10) විවිධ නෞභාරපත්‍ර කිහිපයක් සඳහන් කරන්න.

- පැහැදිලි නෞභාරපත්‍රය
- වගන්ති ගත නෞභාරපත්‍රය
- ගනුදෙනු කළ හැකි නෞභාරපත්‍රය
- ගනුදෙනු කළ නොහැකි නෞභාරපත්‍රය

11) අන්තර්ජාතික වෙළඳාමේදී භාවිතා වන ප්‍රධාන ගෙවීමේ ක්‍රම මොනවාද ?

- ණයවර ලිපි ( Letter Of Credit )
- විනිමය බිල්පත්
- අත්තිකාරම් ගෙවීම් → විද්‍යුත් මුදල් → තැපැල් පැවරුම
- විවෘත ගිණුම් හරහා ගෙවීම්
- ලේඛණ අත්කර ගැනිමේ එකඟතාවයන්

12) විවිධ ණයවර ලිපි ( සලේඛණ ණය ) වර්ග ( Letter Of Credit ) මොනවාද ?

- අවලංගු කළහැකි ණයවර ලිපි
- අවලංගු කළ නොහැකි ණයවර ලිපි
- තහවුරු කළ ණයවර ලිපි
- තහවුරු නොකළ ණයවර ලිපි

13) ණයවර ලිපියක් මගින් ගනුදෙනු වන ආකාරය ( ක්‍රියාවලිය ) විස්තර කරන්න.

දේශීය වෙලඳාමේදී මෙන්ම ජාත්‍යන්තර වෙලඳාමේදීද ගැනුම්කරු සහ විකුණුම්කරු යන දෙදෙනාටම විවිධ ආකාරයේ අවධානම් දැරීමට සිදුවේ.
තමන් වෙත භාණ්ඩ ලැබීමට පූර්වයෙන් මුදල් ගෙවීම මත ආනයනකරුටත්, තමා වෙත මුදල් ලැබීමට පූර්වයෙන් භාණ්ඩ නැව්ගත කිරීම මත විකුණුම්කරුටත් ඇති විය හැකි අවධානම අවම කිරීම සඳහා බැංකුකරුවන්ගේ මැදිහත් වීමක් යොදාගන්නා ක්‍රමවේදයක් ලෙස ණයවර ලිපි හැඳින්විය හැකිය.
ඒ අනුව බැංකුවක් විසින් නියම කරන ලියවිලි , අපනයනකරු විසින් බැංකුව වෙත භාර දුන් පසු ගෙවීම් කිරීමට එකඟ වන කොන්දේසියක් ලෙසද ණයවර ලිපි හැඳින්විය හැකිය.
මෙය වර්තමාන ජාත්‍යන්තර වෙලඳාමේදී භාවිතා වන වඩාත් ජනප්‍රිය ගෙවීම් ක්‍රමයකි.

- විකුණුම්කරුගේ නමින් ඔහුගේ බැංකුවේ ( දැනුම් දෙන බැංකුවේ ) මූල්‍ය පහසුකමක් පිළියෙළ කර දෙන ලෙස ගැනුම්කරු විසින් ඔහුගේ බැංකුවට ( නිකුත් කරන බැංකුවට ) උපදෙස් දෙයි.

⦿ එම මූල්‍ය පහසුකම ලබා ගැනීම සඳහා විකුණුම්කරු විසින් ඔහුගේ බැංකුවට ඉදිරිපත් කළ යුතු ලේඛණ ( උදා - නෞභාරපත්‍රය, රක්ෂණ සහතිකය, ඉන්වොයිස් පත ) පිළිබඳවද, එම ලේඛණ ඉදිරිපත් කිරීමට ලබා දෙන කාලය පිළිබඳවද මෙහිදී ගැනුම්කරු විසින් ඔහුගේ බැංකුවට ( නිකුත් කරන බැංකුවට ) දැනුම් දෙයි. ගැනුම්කරුගේ ණය පහසුකම කල් ඉකුත් වන දිනය පිළිබඳවද මෙහිදී සඳහන් කරන අතර ඒ අනුව එම ණය පහසුකම කල් ඉකුත් වීමට ප්‍රථමව විකුණුම්කරු විසින් ඉහත ලේඛණයන් බැංකුව වෙත ඉදිරිපත් කල යුතුය.
⦿ විකුණුම්කරු විසින් අදාල ලේඛණ බැංකුවට ඉදිරිපත් කල විට බැංකුව විසින් අදාල මුදල විකුණුම්කරුට මුදා හරී.
⦿ විකුණුම්කරුගේ බැංකුව එම ලේඛණ ගැනුම්කරුගේ බැංකුව වෙත එවන අතර ගැනුම්කරුගේ බැංකුව විසින් එම ලේඛණ ගැනුම්කරුට මුදාහරියි.

මේ අනුව මෙහිදී මිල ගෙවීම සිදු වන්නේ විකුණුම්කරු සිටින ස්ථානයේදීය.

ණයවර ලිපි මගින් ගනුදෙනු වන අවස්ථාවකදී ආනයනකරුගේ බැංකුව විසින් ණයවර ලිපි පහසුකම විවෘත කිරීමේදී කාසි ආන්තිකයක්/ මුදල් ආන්තිකයක්/ කෑෂ් මාජින් තැන්පත් කරන ලෙස නියම කරනු ලබන අතර, ආනයනකරු ලේඛණ නිදහස් කර ගැනීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවකදී එකී කාසි ආන්තිකය තහනමට ගැනීමට බැංකුවට හැකියාව පවතී. එසේම බැංකුව විසින්, ණයවර ලිපියේ සම්පූර්ණ වටිනාකම අපනයනකරු වෙත ගෙවීමට බැඳී සිටියි.

මෙම ක්‍රමය පාලනය කරනු ලබන්නේ අන්තර්ජාතික වාණිජ මණ්ඩලයේ සලේඛණ ණය සඳහා වන ඒකීය චාරිත්‍රයන් සහ භාවිතාවන් මගිනි. ( Uniform Customs and Practices හෙවත් UCP )

14) විනිමය බිල්පත්, අත්තිකාරම් ගෙවීම්, විවෘත ගිණුම් හරහා ගෙවීම්, ලේඛණ අත්කර ගැනීමේ එකඟතාවයන් ආදී ක්‍රමයන් මගින් ජාත්‍යන්තර වෙලඳාමේදී ගනුදෙනු වන ආකාරය පැහැදිලි කරන්න.

විනිමය බිල්පත් ➡ මෙහිදී සිදුවන්නේ අදාල භාණ්ඩ තොගයේ වටිනාකමට සමාන විනිමය බිල්පතක් ආනයනකරු විසින්, අපනයනකරු වෙත ලබා දෙන අතර, අපනයනකරු ( විකුණුම්කරු ) විසින් එම විනිමය බිල්පත බැංකුව වෙත ඉදිරිපත් කර මුදල් ලබා ගැනීමයි. මෙය අන්තර්ජාතික වෙලඳාමේදී බහුලව භාවිතා වන ගෙවීම් පියවීමේ ක්‍රමයකි.

අත්තිකාරම් ගෙවීම් ➡ මෙහිදී සිදුවන්නේ භාණ්ඩ තොගය නැව්ගත කිරීමට පෙර එහි සම්පූර්ණ මිල හෝ එම මිලෙන් කොටසක් ගෙවීමයි. එනම් මෙහිදී ආනයනකරු ඉහල අවදානමකට මුහුණ දෙයි. උදා - විද්‍යුත් මුදල්, තැපැල් පැවරුම

විද්‍යුත් මුදල් - මෙහිදී සිදුවන්නේ ණයපත්, හරපත්, විද්‍යුත් මුදල් පසුම්බිය, ඍජු හර පැවරුම් ආදී ඩිජිටල් සහ තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ ආනයනකරු විසින් අපනයනකරු වෙත ගෙවීම් කිරීමයි. කෙසේ වුවද ඉහත ක්‍රමවේදයන් භාවිතා කිරීමේදී දැරීමට සිදුව ඇති සයිබර් අවදානම නිසා වර්තමානයේදී Paypal වැනි අන්තර්ජාතික ගෙවීම් පියවීමේ ක්‍රම භාවිතා කරයි. AmaZon, Alibaba, ebay වැනි වෙබ් අඩවි හරහා on-line සිල්ලර වෙලඳාම ප්‍රචලිතව ඇත.

තැපැල් පැවරුම - මෙහිදී සිදුවන්නේ එක් බැංකුවක් විසින් තවත් බැංකුවක් වෙත කේබල් පණිවිඩයක් ලබා දීම මගින් නම් කරන ලද පුද්ගලයෙකුට මුදල් ගෙවීමයි.

විවෘත ගිණුම් හරහා ගෙවීම් ➡ මෙහිදී සිදුවන්නේ විකුණුම්කරු විසින් භාණ්ඩ නැව්ගත කර අදාල ලේඛණද ගැනුම්කරු වෙත ලැබීමට සැලැස්වීමෙන් පසුව එම භාණ්ඩ සහ ලේඛණ පරීක්ෂා කොට,

ගිවිස ගත් දිනයකදී ගැනුම්කරු ( ආනයනකරු ) විසින් විකුණුම්කරු ( අපනයනකරු ) වෙත ගෙවීම් සිදු කිරීමයි. මෙකී ගෙවීම් කාලසීමාව ( ණය කාලසීමාව ) දින 30, 60, 90 ආදී වශයෙන් විය හැකිය. මෙම ක්‍රමයේ තවත් දිගුවක් ලෙස consignment ක්‍රමය හැඳින්විය හැකිය. එහිදී ආනයනකරු විසින් අපනයනකරුට මුදල් ගෙවීම සිදු කරන්නේ එම භාණ්ඩ අවසාන පාරිභෝගිකයාට විකිණීමෙන් අනතුරුව වේ.
මෙම ක්‍රමයේදී අපනයනකරු ( විකුණුම්කරු ) ඉහල අවදානමකට මුහුණ දෙනු ලබන අතර, විශ්වාසවන්ත පාර්ශවයන් අතර පමණක් මෙම ගෙවීම් පියවීමේ ක්‍රමවේදය භාවිතා වේ.

ලේඛණ අත්කර ගැනීමේ එකඟතාවයන් ( Doccumentary Collection Agreements ) ➡
මෙහිදීද ගෙවීම් පියවීමේ ක්‍රියාවලිය සඳහා දෙපාර්ශවය විසින් සිය බැංකුකරුවන් මැදිහත් කර ගනු ලබයි.
ගැනුම්කරු හෙවත් ආනයනකරුගේ බැංකුව සංග්‍රාහක බැංකුව ලෙසත්, විකුණුම්කරු හෙවත් අපනයනකරුගේ බැංකුව, සම්ප්‍රේෂණය කරන බැංකුව ලෙසත් හැඳින්වේ.

විකුණුම්කරු විසින් භාණ්ඩ නැව්ගත කොට අදාල ලියවිලි සම්ප්‍රේෂණය කරන බැංකුව හෙවත් විකුණුම්කරුගේ බැංකුව වෙත යැවීම

⇩ ⇩ ⇩

සම්ප්‍රේෂණය කරන බැංකුව විසින් එම ලියවිලි ගැනුම්කරුගේ බැංකුව හෙවත් සංග්‍රාහක බැංකුව වෙත යැවීම

⇩ ⇩ ⇩

ආනයනකරු විසින් සංග්‍රාහක බැංකුව වෙත ගෙවීම් සිදු කිරීමෙන් පමණක් සංග්‍රාහක බැංකුව විසින් ආනයනකරු වෙත එම ලේඛණ මුදාහැරීම

<u>මෙහිදී අදාල ලේඛණ පහත පරිදි ගැනුම්කරු අතට පත්වේ.</u>

විකුණුම්කරු → විකුණුම්කරුගේ බැංකුව → ගැනුම්කරුගේ බැංකුව ⤵

ගැනුම්කරු ⇠ ← ← ↵

<u>මෙහිදී අදාල මුදල් පහත පරිදි විකුණුම්කරු අතට පත්වේ.</u>

ගැනුම්කරු → ගැනුම්කරුගේ බැංකුව → විකුණුම්කරුගේ බැංකුව ⤵

විකුණුම්කරු ⇠ ← ← ↵

මෙම ක්‍රමයේදී පිරිවැය සාපේක්ෂව , ණයවර ලිපි ක්‍රමයට වඩා අඩුය. නමුත් ගැනුම්කරු විසින් භාණ්ඩ ප්‍රතික්ෂේප කරනු ලැබීමේ අවධානමකට, විකුණුම්කරු විසින් මුහුණ දීමට සිදුවේ. ⤵ ⤵ ⤵ ⤵

මෙහිදී බැංකු විසින් අපනයනකරුට ගෙවීම් කිරීමට නෛතිකව බැඳී නොමැති අතර, ලේඛණ මත ආනයනකරු විසින් ගෙවනු ලබන මුදල්, අපනයනකරු වෙත සම්ප්‍රේෂණය කිරීමට පමණක් බැංකු බැඳී සිටියි. ඒ අනුව ආනයනකරු ( ගැනුම්කරු ) විසින් භාණ්ඩ භාර ගැනීම ප්‍රතික්ෂේප කලහොත් එහි අවදානම අපනයනකරු ( විකුණුම්කරු ) වෙත පවතී.

ඉහත ගෙවීම් පියවීමේ ක්‍රම අනුව අපනයනකරු සතු ආරක්ෂාව පහත පරිදි වේ.

consignments < විවෘත ගිණුම් < ලේඛණ අත්කර < ණයවර ලිපි < අත්තිකාරම් ගෙවීම්
හරහා ගෙවීම් ගැනිමේ ඒකඟතාවයන්

ඉහත ගෙවීම් පියවීමේ ක්‍රම අනුව ආනයනකරු සතු ආරක්ෂාව පහත පරිදි වේ.

consignments > විවෘත ගිණුම් > ලේඛණ අත්කර > ණයවර ලිපි > අත්තිකාරම් ගෙවීම්
හරහා ගෙවීම් ගැනිමේ ඒකඟතාවයන්

### අන්තර්ජාතික වෙලඳ ආරවුල් නිරවුල් කිරීම

මෙය ප්‍රධානව දෙයාකාරය. ඒ, අධිකරණමය ආරවුල් විසඳීම සහ අධිකරණමය නොවන ආරවුල් විසඳීම ( විකල්ප ආරවුල් විසඳීම ) ලෙසය.

### අධිකරණමය ආරවුල් විසඳීම

ජාත්‍යන්තර වෙලඳ ගිවිසුමකදී එම ගිවිසුම සම්බන්ධ නීතිය සහ අධිකරණ බලය පිලිබඳව සාමාන්‍යයෙන් කරුණු අන්තර්ගත කරනු ලබයි. එහෙත් එලෙස පූර්ව ඒකඟතාවයක් නොමැති අවස්ථා වලදී ගිවිසුම ඇතිකරගනු ලැබූ දේශභූමිය තුල අධිකරණ බලය උද්ගත වන බව සාමාන්‍ය පිලිගැනීමයි.

ඒ අනුව ශ්‍රී ලංකාව තුල අධිකරණ බලය ඇතැයි පෙනී යන්නේ නම් එම ආරවුලේ වටිනාකම මත දිසා අධිකරණය හමුවේ හෝ වාණිජ අධිකරණය හමුවේ නඩු පැවරිය යුතුය. එහෙත් එම ආරවුල ප්‍රවාහන සම්මුතියක් හා බැඳී පවතින්නේ නම්, එම ආරවුල අද්මිරාල්ති අධිකරණ බලය හිමි මහාධිකරණය හමුවේ පැවරිය යුතුය.

එම ආරවුල සම්බන්ධ අධිකරණ බලය විදේශ රාජ්‍යයකට හිමිවුවද, එම විදේශීය අධිකරණ නියෝගයන්, විදේශීය නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥා පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව මෙරට තුල ක්‍රියාත්මක කල හැකිය.

අධිකරණමය නොවන ආරවුල් විසඳීම ( විකල්ප ආරවුල් විසඳීම )

මෙය, සමථකරණය, බේරුම්කරණය සහ වාණිජ මණ්ඩලය වෙත යොමු වීම ලෙස ආකාර කිහිපයකි.

ජාත්‍යන්තර වෙලඳ ගිවිසුම් වල සාමාන්‍යයෙන් ආරවුල් බේරුම්කරණය වෙත යොමු කිරීමේ වගන්තියක් සඳහන් කරනු ලැබේ. එවන් අවස්ථාවකදී යම් ආරවුලක් ඇති වුවහොත් නඩු පැවරීමට ප්‍රථමව බේරුම්කරණය මගින් එම ආරවුල විසඳා ගැනීමට පාර්ශවයන් අනිවාර්‍යයෙන්ම කටයුතු කල යුතුය. බේරුම්කරණ මණ්ඩලයක් විසින් පිරිනමන ප්‍රධානයන් / නියෝග අනුව කටයුතු කිරීමට පාර්ශවයන් බැඳී සිටින අතර, එම නියෝගයන්ට පාර්ශවයන් ස්වේච්ඡාවෙන් අනුගත නොවේ නම් දේශීය අධිකරණයක් තුලදී හෝ 1958 නිව්යෝර්ක් ප්‍රඥප්තිය යටතේ ජාත්‍යන්තර අධිකරණයකදී බලාත්මක කල හැකිය.